**චක්‍ර ලේඛ අංක : sec 2011/03 – 2011.06.08**

**සරල කල එකතු කල අගය මත බදු යෝජනා ක්‍රමය සඳහා උපදෙස්**

2011 අංක 09 දරණ සංශෝධන පනත මගින් පසුව සංශෝධනය කිරීමට යෙදුනු 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතෙහි 2 (2) වගන්තිය ප්‍රකාර , දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන සහ 2011 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන සරල කල එකතු කල අගය මත බදු යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස 2011 මාර්තු 30 දින නිකුත් කළ චක්‍රලේඛ අංක 2011 /02 මගින් නිකුත් කළ උපදෙස් මාලාව මෙමගින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට 2011.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම උපදෙස් මාලාව නිකුත් කෙරේ.

අපනයන සංවර්ධන මණ්ඩලය හෝ රෙදිපිළි පංගු මණ්ඩලය යටතේ බදු අත්හිටුවන යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචිවී සිටින තැනැත්තන්ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි විය යුතු වේ.

01. එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවී සිටින පහත සඳහන් පුද්ගලයන් මෙන්ම එකී ලියාපදිංචි වී සිටින පුද්ගලයන් සඳහා ඕනෑම භාණ්ඩ හෝ සේවාවන් සපයන සැපයුම්කරුවන්ද (වෛකල්පිත එකතු කළ අගය මත බදු ගෙවන්නන් ඇතුළත් නොවේ.) මෙම සරල කල එකතු කල අගය මත බදු යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබති.

i. අපනයනකරුවන් (වැට් බදු පනතේ 7 වැනි වගන්තිය යටතේ ශුන්‍ය අනුපාත සේවාවන් සපයන සැපයුම්කරුවන්)

ii. එකතු කල අගය මත බදු පනතෙහි 1 වන උපලේඛණයෙහි II කොටසෙහි (ර) ඡේදයෙහි (ii) වන උපඡේදයෙහි සඳහන් කර ඇති ඕනෑම විශේෂ ව්‍යාපෘතියක යෙදී සිටින ලියාපදිංචි පුද්ගලයන්

iii 22 (7) වගන්තිය යටතේ ලියාපදිංචි වී සිටින පුද්ගලයන් සහ පනත යටතේ යෙදවුම් බදු හිමිකම් සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්.

iv. අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන අපනයන කරුවන්ට ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ සපයනු ලබන නිෂ්පාදකයන් .

v. අපනයන සඳහා නිෂ්පාදනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක ගුණාත්මකභාවය, ලක්ෂණ සහ වටිනාකම වැඩි දියුණු කිරීමට හේතු වන අගය එකතු කල සේවාවන් අපනයන කරුවන්ට සපයනු ලබන සැපයුම් කරුවන්.

**(සරල කල එකතු කල බදු යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වීම සඳහා වූ ආකෘතිය SVAT 01 වේ.)**

සටහන :

ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයන් කිසිදු මිලදී ගැනීමක් සිදු කිරීමට පෙරාතුව, එම අදාල සැපයුම්කරු මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී නොමැති නම් ලියාපදිංචි වන මෙන් ඉල්ලා සිටින ලෙස දන්වන මෙන් මෙයින් අවවාද කරනු ලැබේ. දින 14 කට නොවැඩි කාලපරිච්ඡේදයක් සඳහා පෙරදාතම ලියාපදිංචි වීමක් සලකා බලනු ලැබේ.

ඉහත ඕනෑම ප්‍රබේදයක් ඇතුළත ඉහත කී යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචිවී සිටින සෑම පුද්ගලයෙක්ම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවකු ( ලි.හ.ගැ.) ලෙසින් හැඳින්වේ. කෙසේ වෙතත් එ.අ.බ.පනත යටතේ ලියාපදිංචි තැනැත්තෙකුට ( ලි.හ.ගැ.) තත්වය පිරිනමන විට, එවැනි පුද්ගලයෙකුගේ ඉහත ( I ) අයිතමය යටතේ දක්වා ඇති ශුන්‍ය අනුක්‍රමික සැපයුම් ප්‍රමාණය ඔහුගේ මුළු බදු මත සැපයුමෙන් 50% වඩා වැඩි වන්නේද යන්න දේ.ආ.දෙ.පරිගනක පද්ධතියෙන් සනාථ කරගනු ලැබේ.

තවද ,ඉහත (iv) සහ (v) අයිතමයන් යටතේ දක්වා ඇති පුද්ගයෙකුට ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවකු (ලි.හ.ගැ.) තත්වය ලබාදීම පිණිස ශුන්‍ය අනුප්‍රමාන සැපයුම්ද ඇතුළුව ඔහුගේ අත්හිටුවන ලද සැපයුම් ප්‍රමාණයක් වන්නේ නම් එම අගය ඔහුගේ මුළු බදු අය කල හැකි සැපයුම් වලින් 50% ට වඩා වැඩි වන්නේද යන්න සනාථ කර ගනු ලැබේ .

ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවකුගේ (ලි.හ.ගැ.) තත්වය සඳහා සුදුසුකම් ලබන පුද්ගලයෙක් විසින් අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී බැර වවුචර් බාරදිය යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංකයන් අයදුම් පතෙහි සඳහන් කළ යුතු වේ. අයදුම්පත ඉදිරිපත් කර ඇති පුද්ගලයා විසින් මුලින් සඳහන් කරන ලද නමක් ඉවත් කර අළුත් නමක් ඇතුලත් කරන ලෙස ඉල්ලීමක් කරන්නේ නම් දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ලිපියක් එවීමකින් මිස ඉහත සඳහන් නම් ඉවත් කිරීමක් සිදු කළ නොහැක.

අදාල ඕනෑම බදු අය කල හැකි කාර්යයක් (මෙම උපදෙස් වල සුවිශේෂී කාර්යයක් ලෙස දක්වා ඇති) කිරීම සඳහා එකතු කළ අගය මත බදු ගෙවීමකින් තොරව භාණ්ඩ මිලදී ගැනීමට හෝ සේවා ලබා ගැනීම සඳහා ලියාපදිංචි හඳුනාගත් ගැනුම් කරුවන් ( ලි.හ.ගැ.) සුදුසුකම් ලබන අතර, එම ලියාපදිංචි හඳුනාගත් ගැනුම් කරුවන් එකතු අගය මත බදු අය කිරීමකින් තොරව භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහාද සුදුසුකම් ලබති. එහෙත් මුළු ශුන්‍ය අනුපාත සැපයුම ඔහුගේ මාසික මුළු බදු වන සැපයුමෙන් 50% කට වඩා අඩු නොවිය යුතුය.

අත්හිටුවන ලද කොන්දේසි යටතේ මිලදී ගැනීම් සිදු කිරීමට අවසර ලත් ලියාපදිංචි පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවක් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. ගැනුම්කරුවෙක් ලි.හ.ගැ. තත්වය ලැබූ අයෙක්ද යන වග තහවුරු කර ගැනීම පිණිස ඕනෑම තැනැත්තෙකුට වෙබ් අඩවියේ ඇති මෙම තොරතුරු අදාල කර ගත හැක.

එකතු කළ අගය මත බදු යටතේ ලියාපදිංචි තැනැත්තන් මෙම යෝජනාවලිය යටතේ මිලදී ගන්නෙකුට කරන සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචිවී ඇත්නම් ඔහු ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවෙකු (ලි.හ.සැ.) ලෙස හැඳින්වේ. එවැනි සැපයුම්කරුවෙකු ලියාපදිංචි හඳුනාගත් ගැනුම් කරුවන් (ලි.හ.ගැ.) වෙත කරන ලද අත්හිටවූ සැපයුම මුළු බදු සැපයුමෙන් 50% කට අඩු නොවන්නේ නම් (පරිපාලන හේතුමත ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවකුගේ තත්වය (ලි.හ.ගැ.) ලබාදෙනු ලැබේ.

## 02. <u>ලි.හ.ගැ. (RIP) සඳහා විශේෂ උපදෙස්</u>

i. සුවිශේෂ කාර්යයක යොදවා ගත හැකි අමුද්‍රව්‍ය , මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ හා අනිකුත් සේවා මිලදී ගැනීම ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරු ( RIS) ගෙන් සිදු කල යුතු අතර, එම මිලදී ගැනීම් අත්හිටුවන ලද මිලදී ගැනීම් ලෙස හඳුන්වනු ලැබේ.

ii. ලි.හ.ගැ සඳහා දෙපාර්තමේන්තුව විසින් අනුක්‍රමික පිළිවෙලින් සමන්විත සරල කරන ලද එකතු කළ අගය මත බදු බැර වවුචර් ( SVCV) ලබාදෙනු ඇත. එක් එක් පොතක වවුචර් 50 ක් අඩංගු වේ. සෑම වවුචරයක්ම අත්සන්කරුවන් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතු වේ. බැර වවුචර් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා අවස්ථාවේදී බැර වවුචර් අත්සන් කරනු ලබන පුද්ගලයින් පස් දෙනෙකුගේ නම් ඔවුන්ගේ නිල නාමය හා ජා.හැ.පිටපත් සමග දැනුම් දිය යුතු වේ. පසුව සිදු කෙරෙන යම් වෙනස්කමක් වේ නම් ඒ පිළිබඳව පූර්ව වශයෙන් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතුය.

iii. වැට් බද්ද අත්හිටවන ලද මිලදී ගැනීම් සම්බන්ධව බැර වවුචරයක් ලි.ප.සැපයුම්කරුවන්ට නිකුත් කරන ලෙස ලි.ප.ගැ. ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එක් සැපයුම්කරුවෙකු ගෙන් ලිත් මාසයක් තුළ සිදුකල මිලදී ගැනීම් වල එකතුව සළකමින් එක් බැර වවුචරයක් නිකුත් කළ යුතුවේ. එනම්, සෑම ගණුදෙනුවක් සඳහාම බැර වවුචර නිකුත් කිරීම අවශ්‍ය නොවේ. ලි.ප.ගැණුම්කරුවන් එසේ නිකුත් කරනු ලබන වවුචර්වල පිටපත් තබාගත යුතුවේ. බැර වවුචර් පොත් අළුතින් අවශ්‍ය වන විට භාවිතා කරන ලද බැර වවුචර් පොත දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුවේ.

iv. මිලදී ගැනීම් සිදු කරන විට ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවෙකු (ලි.හ.සැ.) ගෙන් මිලදී ගන්නා ලෙස සියළුම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් (ලි.ප.ගැ.) ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. 2011 මාර්තු 31 දක්වා ලබා ගන්නා ඉන්වොයිසිය මත ආපසු ගෙවීම් සහ 2011.04.01 දිනට පසුව රේගු අධ්‍යක්ෂ වෙත සිදු කරන ලද ඕනෑම පූර්ව ගෙවීමක් සහ මෙම ඡේදයේ (v) අයිතමයෙන් දක්වා ඇති ඕනෑම අවස්ථාවක හැර වෙනත් කිසිදු තත්ත්වයක් යටතේ ආපසු ගෙවීම් සිදු කරනු නොලැබේ.

v. ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරු නොවන වෙනත් පුද්ගලයකු ගෙන් SVAT 2 (අත්හිටුවන ලද බදු ඉන්වොයිසිය) ලබා ගත නොහැකි අවස්ථාවලදී ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන්ට

යෙදවුම් බදු (තිබේනම්) ආපසු ගෙවීම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි. කෙසේ වෙතත් එසේ ගෙවන ලද වැට් බද්ද අදාල එවැනි සැපයුම්කරුවෙකු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයාට ප්‍රේෂණය කර නොමැති බව පෙනී යන්නේ නම්, දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා විසින් එවැනි ආපසු ගෙවීම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ඇත.

vi. අත්හිටුවන ලද වැට් බද්ද සහ අත්හිටවු මිලදී ගැනීම් සනාථ කරලීම පිණිස මූලාශ්‍ර ලේඛණයක් ලෙස සැපයුම්කරුවන් විසින් නිකුත් කරනු ලබන අත්හිටවූ ඉන්වොයිස් වල පිටපත් තබාගත යුතුය. මිලදී ගැනීම් වල වටිනාකම අත්හිටවූ මිලදී ගැනිම් යටතේ වැට් වාර්තාවේ (J) කොටුවෙහි සඳහන් කළ යුතුය. අත්හිටුවන ලද වැට් බදු ප්‍රමාණය (K) කොටුවෙහි ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත් එවැනි අත්හිටුවන ලද වැට් බද්ද නිමවුම් බද්දෙන් අඩු කළ හැකි යෙදවුම් බද්දක් නොවන බැවින් අත්හිටුවන ලද වැට් බද්ද ආපසු ගෙවිය හැකි නොවේ. වැට් බදු පනතේ විධි විධාන යටතේ යම් යෙදවුම් බද්දක් සඳහා ඉඩදිය නොහැකි නම් එය වැට් වාර්තාවේ 8 කොටුවෙන් දැක්විය යුතුය.

vii. ආනයන සහ දේශීය වශයෙන් මිලදී ගත් භාණ්ඩ හා සේවා ඉහත උපදෙස් මාලාවේ 1 ඡේදයේ අර්ථ දක්වා ඇති යම් විශේෂ කාර්යයක් සඳහා යොදාගෙන තිබේදැයි පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම් දෙපාර්තමේන්තු නිලධාරීන්ට පහසුවීම පිණිස ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් ගෙන් ඉල්ලා සිටින විට සැසඳුම් ප්‍රකාශනයක් සකස් කළ යුතු වේ.

viii. අත්හිටුවන ලද මිලදී ගැනිම් නිශ්චිතවම සඳහන් කරන ලද කාර්ය සඳහා පමණක් යොදා ගත යුතු වේ. ශුන්‍ය අනුප්‍රමාන සැපයුම් හැර එවැනි අත්හිටුවන ලද මිලදී ගැනීම් බදු අයකල හැකි සැපයුමක් සඳහා යොදාගෙන ඇත්නම් එවැනි බදු අයකල හැකි සැපයුම් සඳහා වැට් බද්ද ගෙවිය යුතු වේ. එවැනි අත්හිටුවන ලද මිලදී ගැනුම් යම් නිදහස් සැපයුමක් සඳහා යොදාගෙන ඇත්නම් පනතෙහි 22 වගන්ති ප්‍රකාර ගැලපුම් සිදු කල යුතු වේ. ඉහත සඳහන් කරන ලද කරුණු හැර අත්හිටුවන ලද මිලදී ගැනීම් වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන ඇත්නම් ඒවා බදු අයකල හැකි සැපයුම් ලෙස සැලකේ.

ix. සැපයුම්කරු විසින් නිකුත් කරන ලද භාණ්ඩ /සේවා ප්‍රකාශන ආකෘතිය (SVAT 04) සහ SVAT 05 , 05( a) , 05( b) යන අතිරේක ආකෘති ලැබුණු විට ඒවා නිවැරදි බවට නිසි පරිදි සහතික කොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරිම පිණිස ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් වෙත ආපසු එවිය යුතු වේ. මෙය විද්‍යුත් තැපැල මගින් සිදුකල හැකිය.

x. සියළුම ඉන්වොයිස් අංකයන් සඳහන් කරමින් අත්හිටුවන ලද මිලදි ගැනීම් වල සාරාංශයක් ( SVAT 06) දෙපාර්තමේන්තුවේ සරල කල එ.අ.බ අංශයට ඉදිරිපත් කරන ලෙස ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

xi. බැර වවුචර අවලංගු කිරීම පිළිබඳව සැසඳුම් ලබාදෙන ලෙස ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. (SVAT 06(a)

xii. මුළු නිමැවුම පිළිබඳව ප්‍රකාශන ලබාදෙන ලෙස ගැනුම්කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ( SVAT 03)

xiii. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාවට අනුකූල නොවන බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා ඕනෑම ලි.ප.ගැනුම්කරුවෙකුට සරල කල එ.අ.බ .බැර වවුචර (SVCV) නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ඇත.

xiv. බැර වවුචර් නිදහස් කිරීම හෝ අවශ්‍ය කරනු ලබන වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ඉදිරිපත් කිරීම නොසලකා හැරීම නිසා ඒ සම්බන්ධව අනෙක් පාර්ශවයට කිසියම් අහිතකර බලපෑමක් ඇති වන්නේ නම් එවැනි අවස්ථා වලදී වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් පනතේ සඳහන් ව්‍යවස්ථාමය විධිවිධාන දැඩි සේ යොදා ගනු ඇත. තවද නියමිත වේලාවට බැර වවුචර් ඉදිරිපත් නොකිරීම සම්බන්ධව සැපයුම්කරුවන් ගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීමෙන් පසු කොමසාරිස් ජනරාල් වරයා සෑහීමකට පත්විය හැකි පරිදි එවැනි නොසලකා හැරීම් සැපයුම් කරුට බලපා ඇති බව පෙනී යන්නේ නම් ගැනුම්කරු සම්බන්ධයෙන් තක්සේරුවක් සෑදීම හෝ එවැනි ලියා පදිංචි ගැනුම්කරුවෙකු නුසුදුස්සෙකු බවට ලේඛණගත කර ප්‍රසිද්ධ කළ හැකිය.

xv. සියළුම ලියාපදිංචි ගැනුම්කරුවන් ලිත් මාසයට අදාලව සියළුම ආකෘති පත්‍ර හා විස්තර එම විස්තර ලබාගත් බවට දැනුම් දීමේ ආකෘති පත්‍රයේ පිටපත් 02 ක් සමග (මෙම ආකෘති පත්‍රය වෙබ් අඩවියෙන් ලබාගත හැක.) එවිය යුතුය.

## 03. <u>ලියාපදිංචිය හඳුනාගත් සැපයුම්කරුවන් (ලි.හ.සැ.) සඳහා විශේෂ උපදෙස්</u>

(i) ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් (ලි.හ.සැ.) අත්හිටුවන ලද එ.අ.බ. සඳහන් කරමින් අත්හිටුවන ලද බදු ඉන්වොයිසිය මත ලි.හ. ගැනුම්කරුවන්ට අත්හිටවූ වැට් බදු මත සැපයුම් කළ හැකිය. ලියාපදිංචි පුද්ගලයෙකුට අත්හිටුවන ලද කොන්දේසි යටතේ සැපයුම් සිදු කිරීමට පෙර එවැනි පුද්ගලයෙකු ලි.හ.ගැනුම් කරුවෙකුද නැද්ද යන්න ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් විසින් තහවුරු කරගත යුතුය. (ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන්ගේ ලැයිස්තුවක් වෙබ් අඩවියේ දැක්වේ.)

(ii) වැට් බදු පනතේ 23 වන වගන්තියට අනුව මුදල් පදනම මත ගිණුම් තැබීමට අවසර දී නොමැති නම් එවැනි අය උපචිත පදනම මත සැපයුම් ප්‍රකාශ කළ යුතු වේ. එසේ අවසර දුන් අයගේ බදු වන ඉන්වොයිස් නිකුත් කළ හැකි කාලය වන්නේ සැපයුම්කරු විසින් එම මුදල් ලැබූ කාලයයි.

(iii) අත්තිකාරම් ගෙවීම එම ගෙවීම ලබා ගන්නා ලද බදු කාල පරිච්ඡේදයේදී ප්‍රකාශ කළ යුතු වේ.

(iv) සැපයුම් සඳහා වූ අත්හිටුවන ලද බදු ඉන්වොයිසිය ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරු විසින් එම සැපයුම සිදු කරන අවස්ථාවේදී නිකුත් කළ යුතු වේ. සේවාවන්ට අදාල සැපයුම් කාලය එම සේවාවන් සපයන ලිත් මාසයේ අවසන් දිනට පසුව යෙදෙන දිනයක් නොවිය යුතුය.

(v) ලි.හ.ගැනුම්කරුවන් විසින් සිදු කරන ලද මිලදී ගැනීම් වලට අදාල සරල කළ එ.අ.බ. බැර වවුචරයක් (දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ) නිකුත් කළ යුතුවේ. එක් මාසයක් තුල ඔහු විසින් සිදු කරන ලද මිලදී ගැනීම් වලට අදාලව අදාල මාසයේ අවසානයේ සිට දින 14 කට හෝ ඉන් පෙර එවැනි වවුචර නිකුත් කළ යුතු වේ. ලි.හ.සැපයුම්කරුවන් විසින් සිදු කරන ලද සැපයුම් සම්බන්ධයෙන් අදාල මාසයට පසුව එළඹෙන මාසයේ දින 14 කට පෙර එවැනි බැර වවුචරලබාගත යුතු වේ.

(vi) අත්හිටුවන ලද සැපයුම් වැට් වාර්තාවේ ( D) කොටුවෙහි සඳහන් කළ යුතු අතර අත්හිටුවන ලද වැට් බද්ද( D 1) කොටුවෙහි ඇතුළත් කල යුතුය. අත්හිටුවන ලද සැපයුම් තහවුරු කිරිම සඳහා වාර්තා වෙනම පවත්වා ගෙන යා යුතු වේ. කෙසේ වෙතත් එ.අ.බ. වලින් නිදහස් භාණ්ඩ එ.අ.බ. අත්හිටුවන ලද යෝජනා ක්‍රමය යටතේ සැපයිය නොහැකි බව කරුණාවෙන් සලකන්න.

(vii) යම් ලිත් මාසයක් සඳහා බැර වවුචර හරහා අත්හිටුවන ලද සැපයුම් මත තම වැට් බද්ද නිරාකරණය කිරිම සඳහා ඉල්ලා සිටින තැනැත්තෙක් එවැනි ඉල්ලීම් වැට් වාර්තාවේ (R) කොටුවෙන් ඉදිරිපත් කළ යුතුවේ.

(viii) බදු අයකල හැකි යම් කාලපරිච්ඡේදයකට අදාලව යම් ලියාපදිංචි හඳුනාගත් සැපයුම් කරුවෙකු විසින් ලබා ගන්නා (SVCV) බැර වවුචර අත්හිටවූ සැපයුම් සනාථ කිරිම සඳහා ඉදිරිපත් කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටින්නේ නම් පමණක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුවේ. D 1කොටුවෙහි ඇතුළත් කර ඇති අගය සහ වැට් වාර්තාවේ R කොටුවෙහි සඳහන් කර ඇති අගය අතර විෂමතාවයක් තිබේ නම් එවැනි විෂමතාවයකට අදාල ගැලපීම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඉදිරිපත් කර නොමැති නම් එවැනි සැපයුම් සම්මත සැපයුම් ලෙස සලකනු ලැබේ.

(ix) (SVCV) බැර වවුචර් වලංගු වන්නේ වැට් වාර්තා සම්පූර්ණ කරන ලද නියමිත දින දක්වා පමණි. වවුචර සඳහා ඉල්ලීම් කර නොමැති විටක එවැනි වවුචර් වලට අදාල සැපයුම් බදු අයකල හැකි සැපයුමක් ලෙස සැලකේ.

(x) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පරීක්ෂා කිරීම පිණිස සියළුම වාර්තා සැපයුම්කරු විසින් පවත්වා ගෙන යා යුතු වේ.

(xi) අත්හිටුවන ලද සැපයුම් වලට අදාලව යම් වැට් බද්දක් ආපසු ඉල්ලා සිටීමට සැපයුම්කරු හිමිකම් නොලබයි.

(xii) අත්හිටුවන ලද බදු ඉන්වොයිස් නිකුත් කිරිම හෝ අවශ්‍ය කරනු ලබන වාර්තා දෙ.ආ.දෙ.කො.ජ.වෙත ඉදිරිපත් කිරිම නොසලකා හැරීම සම්බන්ධව අනිකුත් පාර්ශවයන්ට

අහිතකර බලපෑම් ඇති කළ හැකි බැවින් එවැනි අවස්ථාවක වාර්තා ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් වැට් බදු පනතේ සඳහන් ව්‍යවස්ථාමය විධිවිධාන දැඩිසේ යොදා ගනු ඇත.

(xiii) අදාල ලි.හ.ගැනුම්කරුවන් ගෙන් අත්හිටවූ මිලදී ගැනීම් සනාථ කිරිම සහ බදු බැර වවුචර් අංක ලබා ගැනිම සඳහා පරිලෝකනය කරන ලද (SCAN) SVAT 04 සහ SVAT 05 , 05 (a) , 5 (b ) අදාල ලි.හ.ගැ. කරුවන්ට තැපැල් කළ හැකි වේ. ඉන් පසු එය සැපයුම්කරු වෙත ආපසු එවනු ඇත. මුළු නිමවුම් ප්‍රකාශන SVAT 03 ආකෘතියද ඇතුළත්ව භාණ්ඩ/ සේවා ප්‍රකාශන ආකෘති සහ පරිපූරක ආකෘති වල SVAT 05 , 05 (a) , 5 (b ) දෙපාර්ශවය විසින්ම සනාථ කරනු ලදුව pdf ලේඛණයක් ලෙස එක් එක් ගණුදෙනු කරුට වෙන් වෙන් වශයෙන් එක් මාසයක් තුළ සිදු කරන ලද සියළුම ගණුදෙනු වලට අදාලව දේ.ආ.කො.ජ. වෙත ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වෙතත් ඊට SVAT 05 , 05 (a) , 5 (b ) ආකෘතිද excel ආකෘතියේ එවිය යුතු වේ.

(xiv) මාසයක් ඇතුළත සිදුකල සියළුම අත්හිටුවන ලද සැපයුම් වලට අදාල සාරාංශයක් (SVAT 07) pdf ලේඛණයක් හා excel ආකෘතියක් ලෙස ඉදිරිපත් කළ යුතු වේ.

(xv) පරිගනකයෙන් මුද්‍රණය කොට ලබා ගන්නා ලද සියළුම අත්හිටුවන ලද බදු ඉන්වොයිස් (SVAT 02) දෙන ලද පිරිවිතරයන්ට අනුව පාඨයක (test) ආකෘතියක විද්‍යුත් තැපැල හරහා එවිය යුතු වේ. අත්හිටුවන ලද බදු ඉන්වොයිසිය අතින් නිකුත් කරනු ලබන්නේ නම් සහ ලිත් මාසයක් සඳහා එවැනි ඉන්වොයිස් වල මුළු එකතුව 10 කට වඩා වැඩි වන්නේ නම් එය පරිලෝකනය කර විද්‍යුත් තැපැලෙන් එවිය යුතු වේ. එවැනි ඉන්වොයිස් ප්‍රමාණය 10 කට වඩා අඩු වන්නේ නම් ඒවා සරල කල එ.අ.බ. ඒකකයට අතින් බාර දිය යුතු වේ.

(xvi) සියළුම ලි.හ.සැපයුම්කරුවන් සියළුම අවශ්‍ය කරනු ලබන ආකෘති හා ලිත් මාසයකට අදාල වූ විස්තර වෙබ් අඩවියෙන් ලබාගත හැකි ආවරණ ලිපිය ප්‍රකාරව පිටපතක්ද සමගින් සහ සියළුම SVAT 03 , 04, 05 ,05 (a ) , 05 (b) සහ 07 යන ආකෘති බදු කාලයට පසුව එළඹෙන මාසයේ 30 වන දින හෝ එදිනට පෙර සරල කළ එ.අ.බ.ඒකකයට බාර දිය යුතු වේ.

## 04. <u>පොදු උපදෙස්</u>

i. සියළුම ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් විසින් එකතු කළ අගය මත බදු වාර්තාව (වැට් වාර්තාව) මාසිකව ඉදිරිපත් කළ යුතුය.

ii. ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන් හා ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරුවන්ගේ තත්වය (ලි.හ.ගැ.) ලබාදී ඇති සියළුම සැපයුම්කරුවන් වැට් වාර්තාව මාසිකව දිය යුතුය. අනිකුත් සියළුම ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් කාර්තු පදනම මත වැට් වාර්තාව ලබාදිය යුතුය.

iii. විශේෂ ව්‍යාපෘති සඳහා සැපයුම් කරනු ලබන තැනැත්තන් හැර අනිකුත් සියළුම තැනැත්තන් දේශීය ආදායම් ගොඩනැගිල්ලේ 07 වන මහලේ ඇති දත්ත සැකසුම් හා ආදායම් ගිණුම්ගත කිරීමේ අංශයට තමාගේ වැට් වාර්තාව ලබාදිය යුතුය. විශේෂ ව්‍යාපෘති වලට සැපයුම් කරන අය වැට් වාර්තාව දෙවන මහලේ කොමසාරිස් (වැට් බදු) වෙත බාරදිය යුතුය. සියළුම වැට් වාර්තා බදු කාලපරිච්ඡේදයට පසුව එළඹෙන මාසයේ 20 වෙනිදාට පෙර බාරදිය යුතුය.

**05. මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් සඳහා නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍ර පහත පරිදි වේ.**

අ. ලියාපදිංචි කිරීමේ ආකෘතිපත් (SVAT 01 )

ආ. එකතු කළ අගය මත බදු අයකර නොගනිමින් සිදු කරනු ලබන සැපයුම් සඳහා යොදා ගනු ලබන අත්හිටුවන ලද එකතු කල අගය මත බදු ඉන්වොයිසිය.(SVAT 02 )

ඇ. දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති හඳුනාගත් සැපයුම්කරුවන් විසින් සිදු කරනු ලබන සැපයුම් මත වූ එකතු කල අගය මත බදු බැඳියාව හිලව් කිරීම පිණිස ගැනුම්කරු විසින් දෙනු ලබන සරල එකතු කල අගය මත බදු බැර වවුචර (SVCV)

ඈ. මුළු නිමැවුම් ප්‍රකාශය (SVAT 03) ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් හා ලි.ප.සැ.විසින් ඉදිරිපත් කල යුතුය.

ඉ. දෙපාර්ශවය විසින් සැපයුම් තහවුරු කිරීම (SVAT 04 ) මෙය සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය.

ඊ. මාසික පරිපූරක ආකෘති පත් (SVAT 05 ) අදාල මිලදී ගැනුම්කරුවන්ගේ අත්සන ලබා ගැනීමෙන් පසුව මෙය ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය

උ. හරපත් 5 - (a) ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

ඌ. බැරපත5 - ( b ) ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

එ. අත්හිටුවන ලද මිලට ගැනුම් සාරාංශය (SVAT 06 ) ලියාපදිංචි හඳුනාගත් ගැනුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

ඒ. අවලංගු කරන ලද බැර වවුචර සැසඳීම් ප්‍රකාශය (SVAT 0 6(a)

ඔ. අත්හිටුවන ලද සැපයීම් සාරාංශය (SVAT 07)

ආදර්ශ ආකෘති පත්‍ර වෙබ් අඩවියේ ඇත.

06. මෙම උපදෙස් මාලාව කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්වේ. තවද මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් හා අනිකුත් කරුණු සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යාමට අදාලව අවශ්‍ය අවස්ථාහිදී උපදෙස් නිකුත් කරනු ඇත.

S Kandegedara

**කේ.එම්.එස්.කන්දෙගෙදර**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.**